SPUR

**Society for Peace, Unity and Human Rights in Sri Lanka (SPUR) NSW Inc.**
P.O. Box 56, Seven Hills, NSW 1730, Australia
www.spur.asn.au spurnsw@tpg.com.au Tel: 042 303 222 8

A NSW Registered Charity, No: CFN14692. Association Incorporation Act, 1984, No: Y2245239

**මාධ්‍ය නිවේදනය** **සිඩ්නි, 2007 ඔක්තෝබර් 25**

## වීරෝධාර ගුවන් හමුදා සෙබළුනි, යන යකාට කොරහත් බිඳගෙන යාමට ඉඩ නොතබමු

පසුගියදා අනුරාධපුරයේ ගුවන් හමුදා කඳවුරට එල්ලවූ ප්‍රහාරය හමුවේ, බොහෝ මාධ්‍ය කරුවන්, විශ්ලේෂකයන් නොයෙක් අවවාද, විසඳුම් හා දෝශාරෝපන කරන්නට උත්සුක වන බව පෙනේ. මේ අතරතුර, තවත් සමහරු ''කොටින් පරාජය කිරීම ලේසි පහසු වැඩක් නොවේ'' යනුවෙන් හා ''කොටින් පරාජය කළ නොහැක'' යන යල් පැනගිය මතයට නැවත පණ පොවන්නටද සැරසේ.

කවුරු කෙසේ කීවත්, පසුගියදා සිදුවූයේ, වේගයෙන් බොඳවී යන සිය ප්‍රතිරූපය බේරා ගැනීමට සහ තමාගෙන් ඈත්වන ජාත්‍යන්තර ආධාරකරුවන්ගේ සිත් දිනා ගැනීම සඳහා පෙන්වන ලද ගිණිකෙළි සංදර්ශනයක් මිස වෙනෙකක් නොවේ.

නැගෙනහිර පලාතින් ලද අන්ත පරාජයන් හමුවේ, විලිවසාගෙන සිටීමට අපහසුවෙන් දඟලන කොටි නායකයන් මරාගෙන මැරෙන කල්ලි යොදාගෙන මෙවැනි ප්‍රහාරයන් එල්ල කිරීම පුදුමයක් නොවේ. කොටි නාවික හමුදාවේ 10 වෙනි යාත්‍රාවත් සමඟ කොටි සැකිල්ලේ කශේරුකාව බිඳ වැටුනු බව අපගේ විශ්වාසයයි.

මීට අමතරව, ජාත්‍යන්තර කොටි ආධාර කරුවන් විසින් රජයට විරුද්ධව ගෙනයන මිනිස් අයිතිවාසිකම් පිළිබඳ චෝදනා නිසා කොටින්ටද, හමුදා කඳවුරු හැර වෙනස් ස්ථාන වලට ප්‍රහාර එල්ල කිරීම මේ දිනවල එතරම් ගුණදායක නොවේ. පසුගියදා යාල අභයභූමිය තුලින් පැන නැගුනු වෙඩි හුවමාරුවද මෙවැනිම උපක්‍රමයකි.

මේ දිනවල යාපනයේ ඉදිරි ආරක්ෂක වලල්ලට ප්‍රහාර එල්ල කිරීමට දඟලන කොටින්ට බටහිර ඕමන්තයෙහිදී සටන් මගින්ද පසු බාන්නට සිදුවිය. මෙවැනි සිද්ධීන් නිසා සවන් බිමට යවන කොටි කල්ලිවල චිත්ත ධෛර්යයද දියාරුවෙමින් පවතී. තම සාමාජිකයන් තමාට පක්ෂව තබා ගැනීම සඳහාද මෙවැනි උපක්‍රම යොදාගැනීමට ප්‍රභාකරන්ට සිදු වී ඇත.

MJ 24 වර්ගයේ යානා දෙකක්, Bell 212 කොප්ටර් වර්ගයේ යානයක් ඇතුළු යානා කිහිපයක් විනාශ කරමින් සිදු කරන ලද මෙම ප්‍රහාරය මගින් ගුවන් හමුදාවට විශාල පාඩුවක් සිදුවූ බව සැබෑය. නමුත් මීට පෙරදී සිදුවී ඇති විනාශයන් හා සසඳන විට, මෙය අතිශයෝක්තියෙන් විශාල කොට ගුවන් හමුදාව මත දොස් පැවරීමත්, ඔවුන්ගේ චිත්ත ධෛර්යය බිඳ හෙළීමට තැත් කිරීමත් නොහොබිනා ක්‍රියාවකි.

උපදේශකයන්, විශ්ලේෂකයන් පිටතින් සිට මෙබඳු අවවාද, අනුශාසනා, චෝදනා ගෙන ආවත්, තමන් විසින්ම මෙවැනි විනාශයකට උවමනාවෙන්ම මුහුණ දීමට තරම් ගුවන් හමුදාව මෝඩ නොවන බවත්, ඔවුන්ට හැකි උපරිමයෙන් ක්‍රියාකරන්නට ඇති බවටත් කිසිම සැකයක් නැත. ගරිල්ලා යුද්ධයකදී ත්‍රස්තවාදීන් විසින් මෙවැනි විනාශයන් සිදු කිරීම එතරම් පුදුමයක් නොවේ. වටිනා මිනිස් ජීවිත පිළිබඳ අවබෝධයකින් යුතුව, මනා හික්මීමක් යටතේ සටන් කරන හමුදා භටයින් මෙන් නොව, මෙවැනි මරාගෙන මැරෙන ත්‍රස්තවාදීන්ට තැනක් වේලාවක් නොබලා පහර දීමට හැක.

කෙසේ වුවත්, දේශද්‍රෝහීන්ගේ ආධාරය නොමැතිව අනුරාධපුරයට පැමිණ මෙවැනි විනාශයක් කිරීමට නොහැකි බව අපගේ විශ්වාසයයි. මෙම ද්‍රෝහීන් වැනි මිල මුදලට ආත්මය පාවා දෙන්නන් ගේ ආධාර නොමැතිව මෙවැනි විනාශ කල නොහැක. දැනට ආරම්භ කර ඇති පරීක්ෂණ මගින් ඉදිරියේදී මේ සම්බන්ධව වැඩි විස්තර දැන ගැනීමට හැකිවනු ඇත.

මෙම සිද්ධිය මුවාවෙන් හමුදාවන් අධෛර්යයට පත් කරමින් ප්‍රචාරයන් ගෙනයන මාධ්‍ය කරුවන්ගෙන් සහ බංකොලොත් දේශ පාළුවන්ගෙන්, අපගේ වීරෝධාර හමුදා බේරා ගැනීම අපගේ යුතුකමකි.

කොටි නැටුමේ අවසන් භාගය දැන් එළඹී ඇති බවට කිසිම සැකයක් නැත. මේ බව දන්නා කොටි නායකයන් නෝරවේ ආධාර ඇතිව පිටරටකට පැනයාමට සැළසුම් කරන බවටද ආරංචි ඇත.

මේ අවස්ථාවේදී ගුවන් හමුදාවේ වීරෝධාර භටයන්ට අප විසින් දෙන පණිවිඩය නම්, මෙවැනි සිද්ධීන්ගෙන් අධෛර්යයට පත් නොවිය යුතු බවය. වීර ගුවන් හමුදා සහෝදරවරුනි, අප ඔබ සමඟයි, ඉවසීමෙන් වැඩ කරන්න, යන යකාට කොරහත් බිඳගෙන යන්නට ඉඩ නොතබන්න.

අවසන් වශයෙන් මෙහිදී දිවිපිදූ රණවිරුවන් සියලු දෙනාට අපගේ ප්‍රණාමය පුද කරන අතර ඔවුන්ගේ පවුල් වල සියලු දෙනාටත් අපගේ සාතිශය සංවේගය ප්‍රකාශ කර සිටිමු.



නිමල් ලියනගේ
සභාපති
නිව් සවුත් වේල්ස් ස්පර් සංවිධානය, ඔස්ට්‍රේලියාව